## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත තනතුර සඳහා දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර ලේකම්, ප්‍රාදේශීය සභාව, දික්වැල්ල යන ලිපිනයට 2018.05.04 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | රා.ප.ච. 3/2016 (PL 1 2016) අනුව රු. 24,250 - 250x10 - 270x10 - 300x10 - 330x12 - 36,410 කි. 2020.01.01 සිට ක්‍රියාත්මක වන අතර ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව වැටුප හිමිවේ. | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබීම. |
| 02 | සෞඛ්‍ය කම්කරු | 07 | රා.ප.ච. 3/2016 (PL 1 2016) අනුව රු. 24,250 - 250x10 - 270x10 - 300x10 - 330x12 - 36,410 කි. 2020.01.01 සිට ක්‍රියාත්මක වන අතර ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව වැටුප හිමිවේ. | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබීම. |
| 03 | මුරකරු | 01 | රා.ප.ච. 3/2016 (PL 1 2016) අනුව රු. 24,250 - 250x10 - 270x10 - 300x10 - 330x12 - 36,410 කි. 2020.01.01 සිට ක්‍රියාත්මක වන අතර ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව වැටුප හිමිවේ. | අ.පො.ස. (සා.පෙළ) දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත් වීම. |

03. *පැවරෙන කාර්ය භාරය* :-

ආයතනයෙහි කාර්යයන් ඉටුකිරීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන පොදු මූලික අවශ්‍යතාවන් අතුරින් නිශ්චිත, අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නිපුණතාවයකින් තොරව ඉටුකළ හැකි මූලික කාර්යයන් පවරනු ලබන බහු කාර්ය සේවා ගණයකි. මෙම කාර්ය පථයනට අයත් කාර්යයන් අතරින් ඕනෑම කාර්ය භාරයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා/පත්වීම් බලධරයා විසින් පවරනු ලැබිය හැකි ය. ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතරින් ඕනෑම කාර්යයන් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාව පදනම් කරගෙන ඕනෑම ශ්‍රේණියක නිලධාරියෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකි ය.

04. *තනතුරෙහි ස්වභාවය* :-

ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත්විය යුතු වේ.

05. *අමතර සුදුසුකම්* :-

ක්‍රීඩා කුසලතා හා වෙනත් සුදුසුකම් සලකා බැලේ.

06. *පළපුරුද්ද* :-

අදාල ක්ෂේත්‍රයෙහි රැකියා පළපුරුද්දට ප්‍රමුඛතාවය හිමිවේ.

07. *වයස* :-

අයදුම්පත් කැඳවන දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි අය විය යුතු ය.

08. *වෙනත්* :-

අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතු අතර අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 05 ක හා අනුගාමී වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය.

09. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

අයදුම්පත් කැඳවීමෙන් පසුව සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත බඳවා ගැනේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 30 |
| අමතර සුදුසුකම් | 10 |
| පළපුරුද්ද | 10 |
| සභා බල ප්‍රදේශයේ පදිංචිය | 45 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 |

එම්. එස්. රත්නවීර,
ලේකම්,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම් පත්‍රය**

දික්වැල්ල ප්‍රාදේශීය සභාව

....................................... තනතුර

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

01. මුලකුරු සමග නම :————————.
02. මුලකුරු වලින් හැඳින්වෙන නම :————————.
03. ජාතික හැඳුනුම්පත් අංකය :————————.
04. ස්ථිර පදිංචි ලිපිනය :————————.
05. තැපැල් ලිපිනය :————————.
06. ජාතිය :————————.
07. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————.
08. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :————————.
09. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :————————.
10. උපන් දිනය :————————.
11. 2018.05.03 වැනි දිනට වයස :————————.
12. අධ්‍යාපන සුදුසුකම් :————————.
13. පළපුරුද්ද :————————.
14. වෙනත් සුදුසුකම් :————————.
15. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කර තිබේද ?

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සකු කිරීමට හා බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව හොඳාකාරවම දනිමි.

————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.